# NAPLAN (නැප්ලෑන්) 2026

## දෙමාපියන් සහ රැකබලා ගන්නන් සඳහා තොරතුරු



## සිසුන් NAPLAN පරීක්ෂණයට පෙනී සිටින්නේ ඇයි?

ජාතික ඇගයීමේ වැඩසටහන - සාක්ෂරතාව හා ගණිත හැකියාව (NAPLAN) යනු 3, 5, 7 සහ 9 වසරවල සිසුන් පෙනී සිටින සාක්ෂරතාව හා ගණිත හැකියාව පිළිබඳව කෙරෙන ඇගයීමකි. මෙය සියලුම ඕස්ට්‍රේලියානු සිසුන්ට පෙනී සිටීම සඳහා අවස්ථාව ලැබෙන එකම ජාතික තක්සේරුව වේ.

සිසුන් තම පාසල් අධ්‍යාපන වර්ෂයන් තුළ ප්‍රගමනය වන විට, කියවීම, ලිවීම සහ ගණිත හැකියාව යන අත්‍යවශ්‍ය කුසලතා ඔවුන් කෙතරම් හොඳින් ඉගෙන ගන්නේ ද යන්න පරීක්ෂා කිරීම වැදගත් වේ.

NAPLAN මගින් පාසල් විෂය මාලාව හරහා සිසුන් ඉගෙන ගන්නා සාක්ෂරතාව සහ ගණිත හැකියාව පිළිබඳ කුසලතා තක්සේරු කරන අතර, ජාතික ප්‍රවීණතා ප්‍රමිතීන්ට එරෙහිව තම දරුවා ප්‍රගමනය වන ආකාරය ගැන දැන ගැනීමට දෙමාපියන්ට සහ රැකබලා ගන්නන්ට ඉඩ සලසයි.

NAPLAN යනු පාසලේ ඇගයුම් සහ වාර්තා කිරීමේ ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. එය සිසුන්ගේ කාර්ය සාධනය පිළිබඳව ගුරුවරුන් විසින් සිදු කරනු ලබන අඛණ්ඩ ඇගයීම් ප්‍රතිස්ථාපනය නොකරන නමුත්, එමගින් සිසුන්ගේ අධ්‍යාපනික ප්‍රගතිය පිළිබඳ වැඩිදුර තොරතුරු ගුරුවරුන් වෙත ලබා දිය හැකිය.

අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය සහ තරුණ ඕස්ට්‍රේලියානුවන් සාක්ෂරතාවය සහ ගණිත හැකියාව සම්බන්ධව වැදගත් අධ්‍යාපන ප්‍රතිඵල අත්කර ගන්නේද යන්න පිළිබඳ තොරතුරු NAPLAN මගින් පාසල්, අධ්‍යාපන බලධාරීන් සහ රජයන් වෙත ලබා දෙයි.

## ඔබේ දරුවා NAPLAN පරීක්ෂණ මාර්ගගතව සිදු කරනු ඇත

මාර්ගගත NAPLAN පරීක්ෂණ සැලසුම් කර ඇත්තේ නිවැරදි ප්‍රතිඵල ලබා දීම සඳහා වන අතර එමගින් සිසුන්ව නියුක්ත කරවයි. පරීක්ෂණ මනාව සකස් කර (නැතහොත් අනුවර්තනය කර) ඇති අතර, එයින් අදහස් වන්නේ එක් එක් පරීක්ෂණය ශිෂ්‍යයාගේ ප්‍රතිචාර මත පදනම්ව අඩු හෝ වැඩි පමණින් දුෂ්කර විය හැකි ප්‍රශ්න ඉදිරිපත් කරන බවය. මෙය සිසුන්ට ඇගයීමේ නිරතව සිටීමට උපකාර වේ.

මනාව සකස් කරන ලද පරීක්ෂණය මගින් පුළුල් පරාසයක ශිෂ්‍ය හැකියාවන් තක්සේරු කිරීමට සහ ශිෂ්‍ය සාධනය වඩාත් නිවැරදිව මැනීමට ඉඩ සලසයි. ශිෂ්‍යයෙකුගේ සමස්ත NAPLAN ප්‍රතිඵලය ඔවුන් නිවැරදිව පිළිතුරු දෙන ප්‍රශ්න සංඛ්‍යාව සහ ඒවායේ සංකීර්ණත්වය යන දෙකම මත පදනම් වේ. ප්‍රශ්න අභියෝගාත්මකයැයි ඔබේ දරුවාට දැනෙන්නේ නම්, ඒ ගැන ඔවුන් සැලකිලිමත් නොවිය යුතුය; ඔවුන් වඩාත් සංකීර්ණ පරීක්ෂණ මාවතක් වෙත යොමු වෙනවා විය හැකිය.

3 වසරේ සියලුම සිසුන් ලිවීම පිළිබඳ ඇගයුම් පත්‍රිකා භාවිතයෙන් දිගටම කරගෙන යනු ඇත.

## NAPLAN මගින් ඇගැයීමට ලක් කරන්නේ කුමක්ද?

NAPLAN මගින් සිසුන් තම සාමාන්‍ය පාසල් විෂය මාලාව හරහා වර්ධනය කර ගන්නා සාක්ෂරතාවය සහ ගණිත හැකියාව සම්බන්ධ කුසලතා තක්සේරු කරයි.

සිසුන් ලිවීම, කියවීම, භාෂාවේ සම්මුතීන් (අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ විරාම ලකුණු) සහ ගණිත හැකියාව පිළිබඳ තක්සේරු කිරීම් සඳහා පෙනී සිටිති. ප්‍රශ්න මගින් ඕස්ට්‍රේලියානු විෂය මාලාව සමග එකට බැඳී ඇති ඉංග්‍රීසි සහ ගණිත අන්තර්ගතය ඇගැයීමට ලක් කරයි.

සියලුම රාජ්‍ය සහ රාජ්‍ය නොවන අධ්‍යාපන බලධාරීන් NAPLAN පරීක්ෂණ විෂයන් සංවර්ධනය කිරීම සඳහා දායකත්වයක් ලබා දෙති.

NAPLAN පිළිබඳ වැඩිදුර දැන ගැනීමට, nap.edu.au වෙත පිවිසෙන්න

## NAPLAN පරීක්ෂණය සඳහා සහභාගීත්වය

NAPLAN 3, 5, 7 සහ 9 වසරවල සියලුම සිසුන් සඳහා වේ. සියලුම සිසුන්ට ජාතික ඇගයීම් වැඩසටහනට සහභාගී වීමට අවස්ථාව ලැබෙන පරිදි අන්තර්ගත පරීක්ෂණ සඳහා ACARA සහාය දක්වයි.

විවිධ ක්‍රියාකාරී හැකියාවන් සහ අවශ්‍යතා ඇති ආබාධිත සහිත සිසුන්ට ලබා ගත හැකි පිළිසැකසුම් පිළිබඳ තොරතුරු පරීක්ෂණ පරිපාලනය සඳහා යොදා ගන්නා ජාතික ප්‍රොටෝකෝල මගින් සපයනු ලැබේ.

NAPLAN පරීක්ෂණයට ප්‍රවේශ වීමට ආබාධිත තනි පුද්ගල සිසුන් සඳහා අවශ්‍ය සාධාරණ සැකසුම්, එක් එක් සිද්ධිය අනුව, හඳුනා ගැනීමට පාසල් දෙමාපියන්, රැකබලා ගන්නන් සහ සිසුන් සමග කටයුතු කළ යුතුය.

මෙම තීරණ දැනුම් දීමට උපකාරී වීම සඳහා, ඔබට පරීක්ෂණ පරිපාලනය සඳහා යොදා ගන්නා ජාතික ප්‍රොටෝකෝල (ඉහත සඳහන් සබැඳිය), NAPLAN පොදු නිරූපන අඩවිය, NAPLAN වෙත ප්‍රවේශ වීම සඳහා ආබාධිතා සහිත සිසුන්ට උපකාර කිරීමට පාසල්වලට ලබාදෙන මාර්ගෝපදේශය, හෝ NAPLAN සැකසුම් භාවිතා කිරීම පිළිබඳව දෙමාපියන්/රැකබලා ගන්නන්, ගුරුවරුන් සහ ශිෂ්‍යයන් ඔවුන්ගේ අත්දැකීම් බෙදාගන්නා ආකාරය පෙන්නුම් කරන අපගේ වීඩියෝ මාලාව වෙතින් තොරතුරු විමසා බැලිය හැකිය.

සුවිශේෂී අවස්ථා වලදී, තක්සේරුව සඳහා සහභාගී වීමට ඇති හැකියාව දැඩි ලෙස සීමා කරන ආබාධයක් සහිත ශිෂ්‍යයෙකුට, හෝ මෑතකදී ඕස්ට්‍රේලියාවට පැමිණි ඉංග්‍රීසි නොවන භාෂාවක් කතා කරන පසුබිමක් ඇති ශිෂ්‍යයෙකුට විධිමත් විවර්ජනයක් ලබා දිය හැකිය.

ආබාධිත සිසුන් සඳහා වන සැකසුම්හෝ විධිමත් විවර්ජනයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාවලිය පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබේ පාසල් විදුහල්පතිවරයාට සහ ඔබේ ප්‍රාදේශීය පරීක්ෂණ පරිපාලන අධිකාරියට ලබා දිය හැකිය.

## NAPLAN පරීක්ෂණය පැවැත්නවෙන දින වලදී මගේ දරුවා පාසලට නොපැමිණෙන්නේ නම් කුමක් කළ යුතුද?

හැකි සෑම අවස්ථාවකදීම, පරීක්ෂණ සිදු කරන අවස්ථාවේ නොපැමිණෙන තනි පුද්ගල සිසුන්ට මඟ හැරුණු පරීක්ෂණ සම්පූර්ණ කිරීම සඳහා පාසලේ පරීක්ෂණ කාලසටහන තුළ වෙනත් වෙලාවක් පාසල්වලට ලබාදිය හැකිය.

### මගේ දරුවාට උදව් කිරීමට මට කළ හැක්කේ කුමක්ද?

සිසුන් NAPLAN පරීක්ෂණය සඳහා පාඩම් කළ යුතු බව අපේක්ෂා නොකරයි. NAPLAN පරීක්ෂණය ඔවුන්ගේ පාසල් වැඩසටහනේ කොටසක් බව ඔවුන්ට දැනුම් දීම මගින් සහ ඔවුන්ට හැකි උපරිමය කිරීමට ඔවුන්ට මතක් කර දීම මගින් ඔබට ඔබේ දරුවාට උපකාරී විය හැකිය. NAPLAN පිළිබඳ සමහර පැහැදිලි කිරීම් සිසුන්ට පරීක්ෂණවල ආකෘතිය තේරුම් ගැනීම සහ සුවපහසු කරවීම සඳහා උපකාර කිරීමට ප්‍රයෝජනවත් වේ. කෙසේ වෙතත්, දෙමාපියන්/රැකබලා ගන්නන් විසින් මෙය සිදු කිරීම අවශ්‍ය නොවේ. පරීක්ෂණවල අඩංගු ප්‍රශ්න වර්ග පිළිබඳව සිසුන් හුරුපුරුදු බව සහතික කිරීමට සහ  සුදුසු සහාය හා මග පෙන්වීම ඔවුන්ට ලබා දීමට ගුරුවරු කටයුතු කරනු ඇත.

NAPLAN පරීක්ෂණය සඳහා අධික ලෙස සූදානම් වීම හෝ පෞද්ගලික ගුරුවරුන්ගේ සේවා භාවිතා කිරීම ACARA ආයතනය නිර්දේශ නොකරයි.

NAP - Public demonstration site (NAP - පොදු නිරූපන අඩවිය) හි මාර්ගගත NAPLAN ඇගයීම් තුළින් ලබාගත හැකි ප්‍රශ්න සහ මෙවලම් වර්ග බලන්න.

## මගේ දරුවාගේ කාර්ය සාධනය වාර්තා කරන්නේ කෙසේද?

NAPLAN ප්‍රතිඵල ප්‍රවීණතා ප්‍රමිතීන්ට එරෙහිව වාර්තා කෙරේ. එක් එක්  වසර මට්ටමේ එක් එක් තක්සේරු ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතියක් ඇත. ප්‍රවීණතා ප්‍රමිතීන් මගින් ශිෂ්‍ය සාධනය පිළිබඳ පැහැදිලි තොරතුරු සපයයි. ප්‍රධාන වශයෙන් පාසල් අධ්‍යාපනයේ පෙර වසරවල ඉගැන්වූ දේ මත පදනම්ව, NAPLAN පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී දරුවා පිළිබඳව බලාපොරොත්තු වන අභියෝගාත්මක නමුත් සාධාරණ මට්ටමකින් යුතුව ඒවා සකස්කර  ඇත.

ශිෂ්‍ය සාධනය ප්‍රවීණතා මට්ටම් 4කට (එනම් විශිෂ්ඨ, දක්ෂ, සංවර්ධනය වන සහ අමතර සහාය අවශ්‍ය වන) එරෙහිව පෙන්නුම් කරයි.

NAPLAN තනි පුද්ගල ශිෂ්‍ය වාර්තාවක් වසර අවසානයේදී ඔබේ දරුවාගේ පාසල විසින් ලබාදෙනු ඇත. ඔබට වාර්තාවක් නොලැබුණහොත්, ඔබ ඔබේ දරුවාගේ පාසල ඇමතිය යුතුය. වැඩිදුර සහාය අවශ්‍ය නම්, ඔබ ඔබේ අදාළ ප්‍රාන්තයේ හෝ බල ප්‍රදේශයේ පරීක්ෂණ පරිපාලන අධිකාරිය අමතන්න. ACARA හට තනි පුද්ගල වාර්තා සැපයිය නොහැක.

## NAPLAN ප්‍රතිඵල භාවිතා කරන්නේ කෙසේද?

- ගුරුවරුන් සමඟ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා සිසුන්ට, දෙමාපියන්ට සහ රැකබලා ගන්නන්ට තනි පුද්ගල ප්‍රතිඵල භාවිත කළ හැකිය.
- වැඩි අභියෝග හෝ අමතර උදව් අවශ්‍ය සිසුන් හඳුනා ගැනීමට ගුරුවරු ප්‍රතිඵල භාවිත කරති.
- ඉගැන්වීම් වැඩසටහන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ප්‍රබලතාවයන් සහ ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහ සාක්ෂරතා සහ ගණිත හැකියා ඉලක්ක සැලසුම් කිරීමට මෙම ප්‍රතිඵල පාසල් භාවිතා කරති.
- පාසල් වෙත ලබා දෙන වැඩසටහන්වල හා උදව්වල සඵලතාව සමාලෝචනය කිරීමට පාසල් පද්ධති මෙම ප්‍රතිඵල භාවිතා කරති.
- කාලයත් සමඟ පාසල්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු myschool.edu.au වෙතින් ප්‍රජාවට දැක ගත හැකිය.

## වැඩිදුර තොරතුරු මට ලබාගත හැක්කේ කොතැනින්ද?

NAPLAN පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා:

- ඔබේ දරුවාගේ පාසැල අමතන්න
- **nap.edu.au/TAA** ඔස්සේ ඔබේ ප්‍රාදේශීය පරීක්ෂණ පරිපාලන අධිකාරිය අමතන්න
- **nap.edu.au වෙත පිවිසෙන්න**

NAPLAN පරීක්ෂණය සඳහා ACARA ආයතනය පුද්ගලික තොරතුරු හසුරුවන ආකාරය දැන ගැනීමට, **nap.edu.au/naplan/privacy** වෙත පිවිසෙන්න

## NAPLAN කාලසටහන

NAPLAN පරීක්ෂණ කවුළුව දින 9කි. මෙය කෙටි කාල රාමුවක් තුළ පරීක්ෂණ සම්පූර්ණ කිරීමට හැකියාවක් නොතිබිය හැකි පාසල්වලට ඉඩ සැලසීම සඳහා ය. **NAPLAN පරීක්ෂණ කවුළුව 2026 මාර්තු 11 වැනි බදාදා ආරම්භ වන අතර 2026 මාර්තු 23 වැනි සඳුදා අවසන් වේ.** පළමු සතියට ප්‍රමුඛත්වය දෙමින්, පාසල් විසින් පරීක්ෂණ කවුළුව තුළ හැකි ඉක්මනින් පරීක්ෂණ කාල සටහන්ගත කළ **යුතුය**.

| පරීක්ෂණය | කාලසටහන් අවශ්‍යතා | කාල සීමාව | පරීක්ෂණ විස්තරය |
|---|---|---|---|
| **ලිවීම** | 3 වසරේ ශිෂ්‍යයෝ ලිවීමේ පරීක්ෂණය පත්‍රිකා භාවිතයෙන් සිදු කළ **යුතුය**. (පළමු දිනයේ පමණක්)<br>5, 7 සහ 9 වසර වල ලිවීමේ පරීක්ෂණය පළමු දිනයේ පටන් ගත **යුතුය** (පාසල් විසින් ලිවීම නිම කිරීම සඳහා ප්‍රමුඛතාව පළමු දිනයේදී ලබා දිය යුතු අතර, දෙවැනි දිනය භාවිතා කළ යුත්තේ තාක්ෂණික/ප්‍රවර්ධන සීමාවන් පවතින විට පමණි) | 3 වසර: විනාඩි 40<br>5 වසර: විනාඩි 42<br>7 වසර: විනාඩි 42<br>9 වසර: විනාඩි 42 | සිසුන්ට ලිවීමේ උත්තේජකයක් (හෝ මතක් කිරීමක්) ලෙස හැඳින්වෙන අදහසක් හෝ මාතෘකාවක් ලබා දෙන අතර විශේෂිත ප්‍රභේදයකින් (වෘතාන්තයක් හෝ චිත්තාකර්ශක ලිවීම) ප්‍රතිචාරයක් ලියන ලෙසට ඔවුන්ගෙන් ඉල්ලා සිටී. |
| **කියවීම** | ලිවීමේ පරීක්ෂණයෙන් පසු සම්පූර්ණ කළ යුතුය | 3 වසර: විනාඩි 45<br>5 වසර: විනාඩි 50<br>7 වසර: විනාඩි 65<br>9 වසර: විනාඩි 65 | ශිෂ්‍යයෝ තොරතුරු ඇතුළත්, මනඃකල්පිත හා චිත්තාකර්ශක පාඨ පරාසයක් කියවා, ඉන්පසු අදාළ ප්‍රශ්නවලට පිළිතුරු සපයති. |
| **භාෂාවේ සම්මුතීන්** | කියවීමේ පරීක්ෂණයෙන් පසුව සම්පූර්ණ කළ යුතුය | 3 වසර: විනාඩි 45<br>5 වසර: විනාඩි 45<br>7 වසර: විනාඩි 45<br>9 වසර: විනාඩි 45 | අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ විරාම ලකුණු මත සිසුන් ඇගයීමට ලක් කෙරේ |
| **ගණිත හැකියාව** | භාෂා පරීක්ෂණයේ සම්මුතීන්ට පසුව  සම්පූර්ණ කළ යුතුය | 3 වසර: විනාඩි 45<br>5 වසර: විනාඩි 50<br>7 වසර: විනාඩි 65<br>9 වසර: විනාඩි 65 | සංඛ්‍යා සහ වීජ ගණිතය, මිනුම් සහ ජ්‍යාමිතිය, සහ සංඛ්‍යාලේඛන සහ සම්භාවිතාව පිළිබඳව සිසුන් ඇගැයීමට ලක් කෙරේ. |